TTB/2026/I/T

# ජාතික පාසල් ගුරුවරුන්ගේ 2026 වර්ෂයේ ගුරු ස්ථාන මාරු අයදුම්පත පිරවීම සඳහා උපදෙස්

පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් ජාතික ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරෙන්නේ ගුරු සිසු දෙපිරිසගේම යහපත වෙනුවෙනි. එම අරමුණ පෙරදැරි කර ගනිමින් ජාතික පාසල් 396 හි සේවය කරන ගුරුවරුන්ගේ 2026 වර්ෂයට අදාළව ජාතික පාසල් අනිවාර්ය/වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත. ඒ සඳහා අනුගමනය කළ යුතු උපදෙස් මාලාව පහත පරිදි වේ.

1. <u>අයදුම්පත පිරවීමේ දී පහත පියවරයන් අනුගමනය කරන්න.</u>

**<u>අයදුම්පත පිරවීමේදී අනුගමනය කළ යුතු පොදු කොන්දේසි</u>**

1.1 අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර www.nemis.moe.gov.lk දිගුව මඟින් ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට(NEMIS -THRM) තම ජාතික හැඳුනුම්පත් අංකය මඟින් පිවිස, එහි දැක්වෙන තොරතුරු නිවැරදි බවට තහවුරු කර ගත යුතු ය.

1.2 තම තොරතුරු ඇතුළත් ව නැත්නම් හෝ යම් සංශෝධනයක් සිදු විය යුතු නම්, තමා සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ NEMIS සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කර ගත යුතු ය.

1.3 2026.12.31 දිනට වර්තමාන පාසලේ සේවා කාලය වසර 8ක් හෝ ඊට වැඩි නම් හා වයස අවුරුදු 55 ට අඩු නම් අනිවාර්යයෙන් ස්ථාන මාරු අයදුම් කළ යුතු ය.

1.4 2026.07.16 දින සිට 2026.07.30 දින දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම්පත ගුරුවරයා විසින් ම සම්පූර්ණ කර, මුද්‍රිත පිටපත 2026.07.31 දින හෝ එදිනට පෙර තමා විසින් ම විදුහල්පති වෙත භාර දිය යුතු ය. (by hand)

1.5 අයදුම්පත යොමු කළ පසු (submit) නැවත සංශෝධන සිදු කළ නොහැකි බැවින් නිවැරදිභාවය තහවුරු කර ගැනීමෙන් පසු අයදුම්පත යොමු කිරීමට (Submit) සෑම ගුරුවරයකු ම වග බලා ගත යුතු ය.

**2 සැ. යු -: අයදුම්පත පිරවීමට පෙර ජාතික පාසල් ගුරු ස්ථාන මාරු නිර්ණායක , ස්ථාන මාරුවට අදාළ පාසල් කාණ්ඩකරණය සහ අයදුම්පත පිරවීමට අදාළ උපදෙස් පිළිබඳව අවබෝධයෙන් හා සැළකිලිමත්ව කටයුතු කළ යුතුය.**

3. අයදුම්පත පිරවීමට පෙර <u>www.nstt.moe.gov.lk</u> දිගුව ඔස්සේ පිවිස [Login as a Teacher] යන්න තෝරන්න.

4. තිරයේ දිස්වන **<u>උපදෙස් කියවා</u>** අවබෝධ කර ගන්න. අනතුරුව තිරයේ පහළින් දිස්වන **“I have read and understood the guidelines above”** හි ☐ (check box) මත (√) සලකුණු කර, දී ඇති උපදෙස් අවබෝධ කර ගත් බව සහතික කරන්න.

5. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි ව ඇතුළත් කර **"Proceed Click"** කර, අදාළ අයදුම්පත්‍රය වෙත යොමු වන්න. එහිදි **NEMIS පද්ධතියේ ලියාපදිංචි වී ඇති ජාතික හැඳුනුම්පත් අංකය පමණක් භාවිත කළ යුතු ය.**

6. ස්ථාන මාරු අයදුම්පත විවෘත නොවේ නම්, ඔබගේ තොරතුරු ජාතික පාසල් ගුරුවරයකු ලෙස NEMIS පද්ධතිය වෙත ඇතුළත්ව නොමැත. එසේ නම් ඔබ සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ NEMIS සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කර ගත යුතු ය.

7. මෙම අයදුම්පත මුල් පිටුවද සමඟ කොටස් 5 කින් සමන්විත වේ.

7.1 **අයදුම්පතෙහි අංක 1 සිට 31 දක්වා - A . Basic Information (මූලික තොරතුරු)**

සැ.යු. අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී ස්වංක්‍රීයව දිස්වන තොරතුරු නිවැරදි නොවේ නම්, ඔබ සේවය කරන පාසල අයත් කලාප කාර්යාලයේ **NEMIS** සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කරවා ගත යුතු ය. අනතුරුව නැවත මුල සිටම අයදුම්පත පිරවීමට කටයුතු කළ යුතුය.

7.1.1 අංක 1,2,3,4,5,6,7,9,11 තොරතුරු **NEMIS** පද්ධතියේ ස්වංක්‍රීයව දිස්වන තොරතුරු වේ. එහිදි 3,7 අවශ්‍ය වුවහොත් වෙනස් කළ හැකිය.

7.1.2 අංක 11 දිස්වන ස්ථිර ලිපිනය වෙනසක් විය යුතු නම් සංශෝධනය කරන්න. අංක 14,15,16 ස්ථිර ලිපිනයට අදාළ දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ග්‍රාම නිළධාරී වසම තොරන්න. ස්ථිර ලිපිනයේ නොමැතිව තාවකාලික ලිපිනයක පදිංචි වී සිටී නම් අංක 12 තාවකාලික ලිපිනයද අංක 17,18,19 එම තාවකාලික ලිපිනයට අදාළ දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ග්‍රාම නිළධාරී වසම තෝරන්න.

7.1.3 අංක 3හි පූජ්‍ය යන්න තෝරාගනු ලබන්නේ නම් අංක 22 සිට 26 දක්වා අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න.

7.1.4 අංක 13 යටතේ මෙම ස්ථාන මාරුවට සලකා බැලිය යුතු ලිපිනය තෝරන්න.

7.1.5 අංක 20 යටතේ කලත්‍රයාගේ තොරතුරු ඇතුළත් කරන්න.

7.1.6 අංක 21 යටතේ ඔබට දරුවන් සිටී නම් **YES** තෝරන්න. **YES** තෝරන්නේ නම් දරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට වගුවක් දිස් වේ. එහිදී + සලකුණක් ඇති අතර එම සලකුණ තේරීමෙන් එක් එක් දරුවාගේ තොරතුරු ඇතුළත් කළ හැකිය.

7.1.7 අංක 27, 28, 29 යටතේ **NEMIS** පද්ධතියේ ස්වයංක්‍රීයව දිස්වන තොරතුරු සඳහන් වේ.

7.1.8 අංක 29 යටතේ සේවා විස්තර දිස්වන අතර ඔබගේ නිවසේ සිට පාසලට තිබෙන දුර ආසන්න කිලෝමීටර් වලින් සඳහන් කළ යුතු වේ.

7.1.9 අංක 30, 31 නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව **Basic Information** හි තොරතුරු නැවත පරීක්ෂා කර සියල්ල සම්පූර්ණ හා නිවැරදි නම් පමණක් **Are you sure that above Information is Correct** සඳහා **YES** තෝරන්න. **Next Page** මඟින් ඉදිරියට යන්න.

7.2 **අයදුම්පතෙහි අංක 32 සිට 37 දක්වා - B. Additional Information (අතිරේක තොරතුරු)**

7.2.1 අංක 32 යටතේ ඔබගේ පත්වීමේ ස්වභාවය තෝරන්න.

7.2.2 අංක 33 යටතේ පසුගිය වසර 05 තුළ (2022-2026) ඉගැන්වීම් විෂයය කාලසටහනට අදාළව සම්පූර්ණ කරන්න. එහිදී විෂයය ප්‍රාථමික ලෙස තෝරන්නේ නම් උගන්වන පන්තිය නිවැරදිව තෝරන්න.

7.2.3 අංක 36 යටතේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළව පුහුණුවක් ලබා ඇත්නම් **YES** ලෙස තෝරන්න. එහිදී දිස්වන වගුවේ විෂයය හා මාධ්‍ය තෝරන්න.

7.2.4 ඔබ යම් විෂයයකට විද්‍යාපීඨ හෝ වෙනත් වෘත්තීය පුහුණුවක් ලබා ඇත්නම් පමණක් අනු අංක 34 යටතේ වූ කොටස සම්පූර්ණ කරන්න.

7.2.5 ඔබ උපාධියක් සම්පූර්ණ කර ඇත්නම් පමණක් අංක 35 යටතේ වූ කොටස සම්පූර්ණ කරන්න.

7.2.6 අංක 37 යටතේ ඔබ වැටුප් ලබන පාසලෙන් වෙනත් පාසලකට හෝ ආයතනයකට අනුයුක්ත වී සේවය කරන්නේ නම් ඉදිරියේ ඇති කොටුව මත **"Yes. Attached"** යන්න තෝරන්න. ඒ යටතේ අනු කොටස් නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබගේ අනුයුක්ත තොරතුරු සියල්ල ඇතුළත් කිරීමට අවකාශ නොලැබේ නම් ඇමුණුමක් ලෙස පහත වගුව අනුව තොරතුරු සම්පූර්ණ කර අයදුම්පතට අමුණා විදුහල්පති වෙත භාර දෙන්න.

| පළාත | කලාපය | පාසල | අනුයුක්ත කාලසීමාව | | අනුයුක්තය ලබා ගැනීමට හේතු |
|---|---|---|---|---|---|
| | | | දින සිට | දින දක්වා | |
| | | | | | |

7.2.7 **"Additional Information"** හි තොරතුරු නිවැරදි ද යන්න නැවත පරීක්ෂා කර, සියල්ල සම්පූර්ණ හා නිවැරදි නම් පමණක් **"Next Page"** මඟින් ඉදිරියට යන්න.

7.3 **අයදුම්පතෙහි අංක 38 සිට 40 දක්වා - C. Transfer Request (ස්ථාන මාරු ඉල්ලීම)**

7.3.1 අනු අංක 38 යටතේ ඔබ ස්ථාන මාරු අපේක්ෂා කරන ස්ථාන මාරු වර්ගය තෝරා ගන්න.

7.3.2 ජාතික පාසලකින් ජාතික පාසලකට ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්, (**අංක 2 යටතේ සඳහන් කර ඇති කාරණා පිළිබඳව අවධානය යොමු කර මෙම කොටස සම්පූර්ණ කිරීමට වග බලා ගත යුතුය.**) අදාළ පාසල් වර්ගය තේරූ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන ජාතික පාසල් 05ක් නම් කිරීමට අවස්ථාව හිමි වේ. අවම වශයෙන් ජාතික පාසල් 02ක් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකිය.) ස්ථාන මාරු ලබා දීමේදී ඉල්ලා ඇති පාසල් **අනුපිළිවෙල** හා එම පාසල්වල **අදාළ විෂය සඳහා පවතින පුරප්පාඩු** සලකා බලනු ලැබේ. ඔබ තේරූ ජාතික පාසල හා ලිපිනය නිවැරදි ද යන්න නැවත

පරීක්ෂා කරන්න. ඔබ තේරූ පාසල් වෙත ස්ථාන මාරුව සඳහා සැලකිය යුතු ලිපිනයේ (අංක 13 යටතේ සඳහන් කළ) සිට දුර, ආසන්න කිලෝ මීටරයට ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

7.3.3 **ජාතික පාසලකින් පළාත් පාසලකට ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්,** අදාළ පාසල් වර්ගය තේරූ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන පළාත හා එම පළාතේ අදාළ පළාත් පාසල් තෝරන්න. පළාත හා ඉල්ලුම් කරන පාසල නම් කිරීමට අවස්ථා 05ක් හිමි වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකි ය.) අවම වශයෙන් පළාත් පාසල් 02ක් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට නිර්දේශ වුවහොත්, අවශ්‍ය ලේඛන භාර දුන් පසු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ. එහිදී ලබා දෙන පාසල පිළිබඳව තීරණය අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

7.3.4 **ජාතික පාසලකින් ජාතික පාසලකට සහ පළාත් පාසලකට යන අවස්ථා දෙකම අපේක්ෂා කරන්නේ නම්,** අදාළ පාසල් වර්ගය තේරූ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන ජාතික පාසල් 05ක් හා පළාත් පාසල් 05ක් නම් කිරීමට අවස්ථාව හිමි වේ. (පාසලේ නම **Search** කිරීමෙන් පාසල තෝරා ගත හැකි ය.) අවම වශයෙන් ජාතික පාසල් හා පළාත් පාසල් 02 බැගින් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. ස්ථාන මාරු ලබා දීමේ දී ජාතික පාසල් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර එම නිර්දේශ ලබා දීමේදී 7.3.2 සඳහන් කොන්දේසිවලට යටත් වේ.පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට නිර්දේශ ලබා දීමේදී 7.3.3 සඳහන් කොන්දේසිවලට යටත් වේ.

7.4 2026.12.31 දිනට ඔබ එකම ජාතික පාසලේ වසර 8ක් (එනම්, 2018.12.31 දිනට පෙර පාසලට පැමිණි) හෝ ඊට වැඩි කාලයක් සේවය කරන්නේ නම් හා 2026.12.31 දිනට වයස අවුරුදු 55ට අඩු වේ නම් අනිවාර්ය ස්ථාන මාරු සඳහා යටත් වන බැවින්, අනු අංක 39 යටතේ ස්ථාන මාරු ඉල්ලීම සඳහා හේතුව ස්වයංක්‍රීයව සම්පූර්ණ වේ.

7.5 ඔබ වාර්ෂික ස්ථාන මාරු යටතේ වෙනත් හේතුවක් මත ස්ථාන මාරු අයදුම් කරන ගුරුවරයකු නම් අනු අංක 39 යටතේ ඔබ ස්ථාන මාරු අයදුම් කිරීමට හේතුව නිවැරදිව තෝරා ගන්න. හේතුව ලෙස **Medical reason** තෝරන්නේ නම් මුද්‍රිත පිටපත සමඟ පාසල වෙත යොමු කර ඇති **TTB/2026/05** ආකෘතිය සම්පූර්ණ කර අයදුම්පතට අමුණා විදුහල්පතිට භාර දිය යුතුය. මෙම ආකෘතිය www.nstt.moe.gov.lk දිගුව යටතේ **Instructions** යන **Icon** තෝරා ගැනීමෙන් බාගත කළ හැකිය.

7.6 අනු අංක 40 යටතේ, අයදුම්පතෙහි ඔබ ලබා දුන් තොරතුරුවලට වඩා වැඩි යමක් ඇතුළත් කිරීමට ඇත්නම් එය ඉතා කෙටියෙන් සඳහන් කරන්න.

7.7 ඔබ ඇතුළත් කළ තොරතුරු සම්පූර්ණ කර නැවත පරීක්ෂා කිරීමෙන් පසුව නිවැරදි නම් **Next Page** මගින් ඉදිරියට යන්න. ඔබ ලබා දුන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සඳහන් කර **I hereby declare that the information and particulars given above are true and accurate and there are no disciplinary or/and investigation proceedings or/and audit queries. I further acknowledge that mentioning false or misleading information is an offense subject to a**

**disciplinary penalty**. පසුව **Submit Application** මත **Click** කළ පසු අයදුම්පත යොමු කළ හැක.

8. අනතුරුව **Your Teacher Transfer Application is Pending for Principal's Recommendation** යන්න දිස්වූ පසු පහළින් පෙන්නුම් කරන **Download Application** යන්න **Click** කර, ඔබගේ අයදුම්පත බාගත කර ගත යුතු ය.

9. සම්පූර්ණ කරන ලද අයදුම්පත් මුද්‍රණය කිරීමෙන් පසුව ඔබ අයදුම්පත සමඟ අමුණා ඇති ලේඛනවල විස්තර ලියා සම්පූර්ණ කර අත්සන යොදා විදුහල්පති වෙත භාරදෙන්න.

10. එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන එහි දිනය සහ අත්සන යොදා අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය වන **2026.07.31** දින හෝ එදිනට පෙර තමා විසින්ම පාසලේ විදුහල්පති වෙත භාර දිය යුතුය. අයදුම්පතේ මුද්‍රිත පිටපත සමඟ අමුණා එවිය යුතු ලිපි ලේඛන පහත පරිදි වේ.

10.1 ගුරුවරයාගේ මුල් පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත

10.2 වර්තමාන සේවා ස්ථානයට ස්ථාන මාරු ලැබූ ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත

10.3 2026 වර්ෂයේ පෞද්ගලික කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත

10.4 පත්වීම් විෂයය නොවන විෂයයන් උගන්වන්නේ නම් ඒ සඳහා වන ඉහළ ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමට අදාළ සහතිකවල සහතික කළ පිටපත

10.5 වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට ඇත්නම්, රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ රෝගියාට ප්‍රතිකාර කරනු ලබන විශේෂඥ වෛද්‍යවරයා විසින් නිර්දේශ කරන ලද **TTB/2026/05** ආකෘතිය

10.6 **TTB/2026/I/T** උපදෙස් පත්‍රිකාවේ 7.2.6 යටතේ දක්වා ඇති පරිදි අනුයුක්ත තොරතුරු සියල්ල ඇතුළත් කිරීමට අවකාශ නොලැබෙන විට විදුහල්පති සහතික කළ අනුයුක්ත තොරතුරු පිළිබඳ ආකෘතිය

10.7 ආගමික ස්ථාන භාරව කටයුතු කරන පූජ්‍ය පක්ෂය (විහාරාධිපති, මීසම්භාර පියතුමන්) ඒ බව තහවුරු කළ හැකි සහතිකයේ සත්‍ය පිටපත

10.8 වෙනත් ආයතන වලට අනුයුක්තව රාජකාරි කරන්නේ නම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දුන් අනුමැතිය

10.9 විදේශ නිවාඩු අනුමත වී ඇත්නම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දුන් අනුමැතිය

11. නව ජාතික පාසල් ගුරුවරුන්ට (ඇමුණුම 01) 2026 වර්ෂයට අදාළව ජාතික පාසල් අනිවාර්ය/වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට අවස්ථාවක් ලැබෙන අතර එම ගුරුවරුන් ජාතික පාසල්වල සේවය කිරීමට එකගතාව ලිඛිතව පෞද්ගලික ලිපි ගොනුව වෙත අනිවාර්යෙන්ම ලබා දිය යුතුය.

12. **පොදු කරුණු -**

12.1 ඕනෑම අවස්ථාවක ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය මගින් www.nstt.moe.gov.lk දිගුව ඔස්සේ පිවිස ස්ථාන මාරු අයදුම්පත පිළිබඳ වර්තමාන තත්ත්වය පරීක්ෂා කළ හැක.

12.2 අයදුම්පත පූරවා **Submit** කළ හැක්කේ එක් වරක් පමණි.

12.3 අයදුම්පත පිරවීමේ දී ඉහත කරුණුවලට අමතරව යම් තාක්ෂණික ගැටලුවක් පවතී නම් 011-2075854 හෝ 011-2784434 දුරකථන අංකවලට රාජකාරී කාලය තුළ දැනුම් දිය හැක.

13. 2026 ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ක්‍රියාවලියට අදාළ නිර්ණායක, පාසල් කාණ්ඩකරණය, උපදෙස්, ස්ථාන මාරු තීරණ, අභියාචන තීරණ යනාදී සියලුම කාරණා සම්බන්ධයෙන් වන තොරතුරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථානමාරු ශාඛාව හරහා විදුහල්පතිවරුන් මගින් දැනුවත් කිරීම සිදු කරන බැවින් මීට අදාළ උපදෙස්, පැහැදිලි කිරීම <u>ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව මගින් පමණක්</u> ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

14. ජාතික පාසල් ගුරු ස්ථාන මාරු පිළිබඳ සියලුම තීරණ අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථානමාරු ශාඛාවේ nstt.moe.gov.lk යන **Portal** එක මගින් පමණක් පළවන බැවින් ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය යොමු කර එමගින් පමණක් තොරතුරු ලබා ගැනීමට වග බලා ගත යුතුය.

ජේ.ජේ.එස්.එස්. එදිරිසූරිය,
අතිරේක ලේකම් (ආයතන),
අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය